# 10 ශ්‍රේණිය ඉතිහාසය

ක්‍රියාකාරකම් පත්‍රිකාව පිළිතුරු පත්‍රය

## ඒකකය 2

## ශ්‍රී ලංකාව ජනාවාස වීම -03





## මුල් ඓතිහාසික යුගය

අයි.එම්.ධම්මික කුමාර ඉලංකෝන් (ගුරු උපදේශක)
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල

# මුල් ඓතිහාසික යුගය

1.ඉතිහාසය පෙළ පොත හා මෙම පාඩමට අදාළ කියවීම් පත්‍රිකාව හොඳින් කියවා පහත සඳහන් ක්‍රියාකාරකම් වල නිරත වන්න. නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

01. මුල් ඓතිහාසික යුගයේ ශ්‍රී ලංකාවේ ජනාවාසවල ව්‍යාප්තිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට වැදගත් වන සාධකය මින් කුමක්ද?

1. ගම් වැව්වල ව්‍යාප්තිය 2. දාගැබ්වල පිහිටීම
3. රතු - දුඹුරු පස්වල ව්‍යාප්තිය 4. තැනිතලා බිම්වල ව්‍යාප්තිය

02. ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය ගංගා නිම්වලින් පිටත ප්‍රදේශවල සිදු වූ බව නූතන පුරා විද්‍යාඥයන්ගේ මතය වී තිබේ. ඒ බව සනාථ කෙරෙන ගංගා නිම්නයක් වන්නේ කුමක්ද?

1. ගල් ඔය 2. කිරිඳි ඔය 3. මල්වතු ඔය 4. යාන් ඔය

03. ලංකා ඉතිහාසයේ පළමුවරට ඔයක් හරහා අමුණක් තැනූ පාලකයා වශයෙන් සැලකෙනුයේ,

1. වසභ රජුය 2. මහසෙන් රජුය
3. පළමුවන අග්බෝ රජුය 4. ඉළනාග රජුය

04. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගංගා නිම්නවලින් පිටත, කුඩා වැව් පද්ධති ආශ්‍රිතව ජනාවාස ව්‍යාප්ත වීම ආරම්භ වූවා යැයි සැලකෙනුයේ,

1. ප්‍රාග් ඓතිහාසික යුගයේදී ය. 2. පූර්ව ඓතිහාසික යුගයේදී ය.
3. මුල් ඓතිහාසික යුගයේදී ය. 4. ඓතිහාසික යුගයේදී ය.

05. අනුරාධපුරය නුරුපුර ලෙස හඳුන්වා ඇති ප්‍රසිද්ධ අභිලේඛනය කුමක් ද

1. වල්ලිපුරම් සන්නස 2. පනාකඩුව සන්නස
3. සීගිරි කැටපත් පවුර 4. දෙවනගල ලිපිය

06. පැරණි බ්‍රාහ්මී ලිපිවල පුරකමත යනුවෙන් හඳුන්වා ඇති නිළධාරියා කවුරුන් ද?

1. ප්‍රධාන වාස්තු ශිල්පියා 2. නගර ගුත්තික.
3. මුදල් අයකැමි. 4. දණ්ඩනායක.

- පහත සඳහන් ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

**01.**

I. සාහිත්‍ය මූලාශ්‍රය වල සඳහන් වාපී ගම්මාන 03 ක් නම් කරන්න

සුමනවාපිගාම , විහාරවාපිගාම, හුන්දරිවාපිගාම, කඩහවාපිගාම

II. පහත සඳහන් වෘත්තිකයන් සෙල්ලිපි වල හඳුන්වා ඇති ආකාරය අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. වඩුවන් විසූ ගම - වඩ්ඪකීගාම

B. ගොවියන් විසූ ගම - කසීකාරගාම

C. මැණික් ගැරූ අය ජීවත් වූ ගම - මණිකාරගාම

D. සත්ත්ව පාළනයේ නිරත වූ අය ජීවත් වූ ගම - ගෝපාලගාම

III. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස සඳහා පුදේශ තෝරාගැනීමේදී අවධානය යොමු කළ කරුණු හා ඒ සඳහා බලපෑ හේතු කෙටියෙන් විස්තර කරන්න.

වාර්ෂිකවර්ෂාපතන අගය

පසේ ස්වභාවය

භූ විෂමතාව

ස්වාභාවික සම්පත්වල ව්‍යාප්තිය

ජලවහනය

මෙම යුගයේ මිනිසා කෘෂිකාර්මික ජීවිතයකට හුරුව තිබූ නිසා වගා කටයුතු සඳහා සුදුසු භූමියක් තෝරාගත් අතර ජලය ලබාගැනීමට වැව් ඉදිකිරීමට සුදුසු පරිසරාත්මක සාදක පිළිබඳව ඔවුන්ගේ අවධානය යොමු විය.ඒ නිසා ඔවුන් තම ජනාවාස සඳහා ප්‍රදේශයක් තෝරා ගැනීමේ දී වාර්ෂික වර්ෂාපතන අගය , පසේ ස්වභාවය , භූ විෂමතාව හා ජලවහනය ආදී කරුණු පිළිබඳව අවධානය යොමු කරන ලදී. එසේම මෙම යුගයේ මානවයා විවිධ කර්මාන්ත වල නිරතව සිටි බැවින් ඒ ඒ කර්මාන්ත සඳහා අවශ්‍ය කරන ස්වභාවික සම්පත්වල ව්‍යාප්තිය පිළිබඳවද අවධානය යොමු කරන ලදී.

**IV.** මුල් ඓතිහාසික ජනාවාස වල ව්‍යුහය හා ස්වරූපය කෙටියෙන් විස්තර කරන්න.

මුල් ඓතිහාසික යුගයේ මිනිසා ගංගා නිම්නයට පිටතින් තම ජනාවාස පිහිටුවා ගන්නා ලදි. සරුසාර ගංගා නිම්නයේ තම ජනාවාස පිහිටුවා නොගෙන ගංගා නිම්නයට පිටතින් ජනාවාස පිහිටුවා ගැනීමට යම් හේතුවක් තිබිය යුතුය. ගංගා මගින් වාර්ෂිකව ගෙනෙන විනාශකාරී ගංවතුර පාලනය කිරීමට සරිලන තාක්ෂණයක් ඒ වන විට නිපදවා නොමැති වීම ඊට බලපෑ ප්‍රධානතම හේතුව විය හැකිය. මුල් ඓතිහාසික ජනාවාස වල ව්‍යුහය හා ස්වරූපය කෙටියෙන් පහත සඳහන් අකාරයට කෙටියෙන් ගොණු කළ හැකිය

1.කුඩා ගම් වැව් මූලික කරගෙන බිහිවී ඇත (වාපී ගම්මාන උදා -සුමනවාපිගාම , විහාරවාපිගාම, හුන්දරිවාපිගාම, කඩහවාපිගාම )

2.ගංගා නිම්නයට පිටතින් පිහිටා තිබීම

3.ජනාවාස එකිනෙකින් ස්වාධීන පිහිටා තිබීම (කැලෑ තීරයකින් ගම්මාන වෙන්ව තිබීම)

4.විවිධ වෘත්තිකයින් විසූ ගම්මාන පිහිටා තිබීම

1 කසීකාරගාම - ගොවියන් විසූ ගම්

2 මණිකාරගාම - මැණික් ගැරූ හෝ මැණික් කැපූ අය ජීවත් වූ ගම්

3 ගෝපාලගාම - ගොපල්ලන් විසූ ගම්

4 කේවට්ටගාම - ධීවරයින් විසූ ගම්

5 කුම්භකාරගාම - වළං සාදන්නන් විසූ ගම්

6 වඩ්ඩකීගාම - වඩුවන් විසූ ගම්

5. කාර්යය පදනම් කොට ගෙන ක්‍රියාත්මක වූ ගම් පිහිටා තිබීම

7 පට්ටනගාම - වරාය ආශ්‍රිත ව තිබූ ගම්

8 නියම්ගම් - වෙළෙඳ ගම්

9 ඔළගම් - ජනතාව විසින් අතහැර දැමූ වැව්ගම්

6. ගමෙහි ජීවත්වනමිනිසුන්ගේ ප්‍රමාණය අනුව ගම් ,නගර ,පුර ආදී ලෙස ජනාවාස වර්ග කළ හැකි වීම.

7. වැටකින් ආරක්ෂා වූ හෝ නොවූ ගම් පිහිටා තිබීම( පරික්ඛිත ගම්, අපරික්ඛිත ගම්)